කොවිඩ්-19 වසංගතයේ බලපෑමේ දායකත්වයද සමගින් සිදුවන දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදීද මාධ්‍ය විසින් අතිශයින්ම ප්‍රවේසම් සහගත, දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති ආචාර ධර්මයන්ට අනුකූල ප්‍රවේශයක් ගත යුතු බව අවධාරණය කළ යුතු වේ. මන්දයත්, මෙම දිවි අහිමි කරගැනීම්ද තවත් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ ඉඩක් තිබිය හැකි බැවිනි.

දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීම සඳහා වන මාධ්‍ය ආචාර ධර්මයන් තුළ, දිවි අහිමි කරගැනීම ප්‍රමුඛත්වයකින් යුතු පුවතක් ලෙසින් වාර්තා නොකරන ලෙසින් උපදෙස් දෙන්නේ, ඒ ඔස්සේ ඊට වැඩි අවධානයක් හිමි වීම සහ අනුකාරක දිවි අහිමි කරගැනීම් සිදුවීම වැළැක්වීමටයි. එසේම දිවි අහිමි කරගත් ආකාරය පළ නොකරන ලෙසට උපදෙස් දෙන්නේද එම ක්‍රමය අනුකරණය කරමින් දිවි අහිමි කරගැනීම් සිදුවීම වැළැක්වීමටයි. දිවි අහිමි කරගැනීමට හේතු වූ කරුණ සරලව නොදක්වන ලෙසින් පැවසෙන්නේ, දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු කාරණාවන් තිබිය හැකි බැවිනි.

එසේම දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීමේදී උපකාරක අංක සඳහන් කරන මෙන් පැවසෙන්නේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට අවස්ථාවක් සැලසිය හැකි බැවිනි.

ආචාර ධාර්මික වාර්තාකරණයක යෙදීම මාධ්‍ය වගකීමයි. ඒ වගකීම ඉටු කිරීම ඔස්සේ තවත් ජීවිත රැකගැනීමට හැකිවීම එහි ප්‍රතිලාභයයි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #Dailymirror #Dinamina #Aruna #Lankadeepa